# පෙළ දහමින් ප්‍රකටවන
## විශ්ලේෂණය හා යථාවබෝධය

මහාචාර්ය පූජ්‍ය දේවාලේගම මේධානන්ද හිමි
අංශාධිපති - පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

විශ්ලේෂණය (Analyse) හෙවත් විභජනය වූ කලි ඉතා වැදගත් අධ්‍යයන, පර්යේෂණ විධික්‍රමයෙකි. ඉන් අදහස් කෙරෙනුයේ බෙදීම, වෙන් කිරීම, කොටස් කිරීම නොවේ නම් මූල සාධක දැක්වීමයි. එහෙත් මෙහිලා විශ්ලේෂණ යන්නෙන් හුදෙක් අධ්‍යයනය පර්යේෂණ අපේක්ෂාවකින් තොරව, කිසියම් සත්‍යයක් හෙළිදරව් කරගැනීමේ අරමුණකින් තොරව බෙදීම අදහස් නොවේ. කිසියම් ඵලදායක අරමුණක් ඇතිව ම විශ්ලේෂණාත්මක අධ්‍යයනයන් සිදු කරනු ලබන අතර විටෙක එසේ විශ්ලේෂණයට, විභජනයට නොවේ නම් බෙදා දැක්වීමට ලක්වනුයේ භෞතික සත්තාවක් විය හැකිය. තවත් විටෙක එය කිසියම් ආධ්‍යාත්මික තත්ත්වයක් ද විය හැකිය. එසේම කිසියම් ප්‍රස්තුතයක් හෝ සංකල්පයක් හෝ ඉගැන්වීමක් ද විය හැකිය. බෙදීම වෙන් කොට ගැනීම කවර කරුණක් වුවද සියුම් ලෙසත් පුළුල් හා නිරවද්‍ය ලෙසත් නිරීක්ෂණයට හසුකරලීමට උපකාරී වෙයි. එමගින් ඒ පිළිබඳ සැබෑ දැනුමක් උපයා ගත හැකිය.

විශ්ලේෂණය යනු සංස්කෘත ව්‍යවහාරයකි. ආ පූර්ව ශ්ලිෂ් ධාතුවෙන් නිපන් එය ආශ්ලේෂණ යන්නෙහි විරුද්ධාර්ථය ගෙන එයි. විශ්ලේෂණ යන්නෙන් සළකා ගනු ලබන උක්ත අර්ථය හඟවන පාලි ව්‍යවහාරය "විභජන" යන්නය. (distinction, division, going in to detai)විභජිත (dividing , Analysing, detailing in detail)[1] මූලික විද්‍යාත්මක අධ්‍යයන, පර්යේෂණ ක්‍රමයක් වශයෙන් බුදුසමය ආදියෙහි

පටන්ම විශ්ලේෂණය හෙවත් විභජනය නිබඳවම භාවිතා කොට ඇති ආකාරය පිළිබඳ විමසුමක් කිරීම මෙම ලිපියෙහි අපේක්ෂාවයි. වඩාත් පැරණි යැයි පිළිගැනෙන පාලි සූත්‍රාන්තයන්හි විභජනය ඉතා සාර්ථක අධ්‍යයන ක්‍රමයක් ලෙස භාවිත විය. එසේම අභිධර්මය ද එකී සූත්‍ර හා අභිධර්ම මූල ග්‍රන්ථයන්ට පසුකාලීනව සපයන ලද විවිධ අර්ථකථන හා සංග්‍රහ ග්‍රන්ථයන්ද විශ්ලේෂණය භාවිත කර ඇති අයුරු සිත්ගන්නා සුළු වෙයි. විශ්ලේෂණය කිරීම විස්තර කිරීම හා අත්‍යන්තයෙන් බැඳී පවතියි. විස්තර කිරීමකින් හෙවත් එකිනෙක කරුණු විවිධ පැතිවලින් හෙළිදරව් කිරීමකින් තොරව සැකෙවින් දැක්වීම උද්දේසයයි. භාග්‍යවතුන් වහන්සේ ඇතැම් විට උපදේසය පමණක් වදාළහ.[2] විභංගය නොවදාළහ. පරියාය යන්නද මීට සමීප වූ අර්ථ ඇත්තකි. ඇතැම් තැනෙක බුදුරදුන් අනෙක පරියායෙන් දහම් දෙසන බව දක්වා ඇත. එහි අනෙක පරියාය යන්න පැහැදිලි කෙරනුයේ විවිධාකාරයෙන් බෙදා දැක්වීම යනුවෙනි. [3] බුදුරදුන් විසින් කරුණු පැහැදිලි කිරීම, තේරුම් කිරීම හෙවත් ව්‍යාකරණය සිව් ආකාරයකින් සිදුකරනු ලැබේ. එකංස ව්‍යාකරණය හෙවත් එක් අන්තයෙකින් එකක් ලෙස සලකා කරුණු පැහැදිලි කිරීම, විභජ්ජා ව්‍යාකරණය එනම් ඉහත දැක්වූ පරිදි බෙදා විශ්ලේෂණය කොට කරුණු දැක්වීම, පටිපුච්ඡා ව්‍යාකරණය එනම් ශ්‍රාවකයාගෙන් ප්‍රතිප්‍රශ්න විමසා කරුණු දැක්වීම, ඨපනීය එනම් අදාල නොවන හෝ අර්ථශුන්‍ය කරුණු නොදක්වා මතු කළ ගැටලුව පසෙකින් තැබීම යනුවෙනි.[4] මේ අනුව විභජනය, විශ්ලේෂණය බුදුදහමෙහි කරුණු විස්තර කිරීමේ, ගැටලුව විසඳීමේ එක් ක්‍රමයක් වෙයි.

මජ්ඣිම නිකාය උපරිපණ්ණාසකය වග්ග පසෙකින් සමන්විත වන අතර එහි සිව්වැන්න හඳුන්වා ඇත්තේ විභංග වග්ගය ලෙසය. විභංග යනු විභජන යන්නට ම සමානාර්ථවත් පදයකි. බෙදීම, බෙදා විස්තර කිරීම යනු එහි අර්ථයයි. එම වග්ගය සූත්‍ර දේශනා දොළහකින් යුක්තවන අතර විභංග සූත්‍ර නාමය සහිත දේශනා අටක් ඊට ඇතුලත් වෙයි. එකී එක් එක් සූත්‍රය විවිධ දහම් කරුණු විභජනය කොට ව්‍යාකරණය කරයි. චූලකම්ම





විභංග, මහාකම්ම විභංග, සළායතන විභංග, උද්දේස විභංග, අරණ විභංග, ධාතු විභංග, සච්ච විභංග, දක්ඛිණ විභංග යනුවෙන් එම සූත්‍රාන්තයන් නම් කරනු ලැබ ඇත. මේ හැර විභංගනය අනුව ප්‍රකාශිත තවත් සූත්‍ර දේශනා පෙළදහමෙහි දැකගත හැකිය. මේ අනුව විභජන විභංග හෙවත් විශ්ලේෂණ ක්‍රමය ආදි බුදුසමය තුලින්ම හඳුන්වා දෙන ලද්දකි. පසු කාලීනව විශ්ලේෂණාත්මක අධ්‍යයනය වෙසෙසින්ම සංවර්ධනය වීම අභිධර්ම පිටකයෙන් මැනවින් පැහැදිලි වෙයි. ථෙරවාදී අභිධර්මය ප්‍රධාන ප්‍රකරණ සතෙකින් යුක්ත වන අතර විශ්ලේෂණය ඔස්සේ නිගමන වලට එළඹීම එහි ප්‍රමුඛතම ලක්ෂණයක් වී ඇත. එම ප්‍රකරණ සතෙන් එකක් විභංග ප්‍රකරණ නමින් හඳුන්වා ඇත්තේය. මේ හැර පශ්චාත් අටුවා ටීකාදියෙහි ද කරුණු පැහැදිලි කිරීම පිණිස එම නය නිබඳව ම යොදාගෙන තිබේ. විභජ්ජවාදය යනු ථෙරවාදයට අපර නාමයකි.[5] අට්ඨකථාවන්හි ථෙරවාදයට විභජ්ජවාදය යැයි හඳුන්වා ඇත. බුදුරදුන් කිනම්වාදී දැයි ධර්මාශෝක රජු විසින් විමසූ විට මහරජ සම්මා සම්බුදුරදුන් විභජ්ජවාදී යැයි මොග්ගලී පුත්ත තිස්ස හිමියෝ පැවසූහ.

බුදුසමය මූලික වශයෙන්ම පෙන්වා දෙන අකාරයට සත්ව ප්‍රජාව ඉදිරියේ ඇති ප්‍රමුඛතම ගැටලුව, සෙසු සියලු ආකාරයේ අතිරේක ගැටලු ඉක්මවා සිටින මහ ගැටලුව නම් අසාර වූ, තුච්ඡ වූ, අතෘප්තිකර වූ අර්ථ ශුන්‍ය වූ ප්‍රවෘත්තියක් පැවැත්මක් උරුමව තිබීමය. මෙය පාලියෙහි එන දුක්ඛ යන ව්‍යවහාරයෙහි ගැඹුරු අර්ථය වේ.[6] මෙකී සංසාරගත දුක පිලිබඳ යථාර්ථවාදී දැක්මක් අවදිකමක් මිනිසා තුළ ජනිතකරලීමත්, එකී දුකින් අත් මිදෙනු පිණිස අවශ්‍ය වන මග පෙන්වා දීමත් ආදී බෞද්ධ චින්තනයෙහි ප්‍රමුඛතම අපේක්ෂාව වන්නේය.[7] එහිදී සදාකාලික නිත්‍ය අවිනශ්වර ආත්මයක් ඇත යන ශාස්වත දෘෂ්ටිය මෙන්ම, එවන් ආත්මයක් නැත සියල්ල මරණයෙන් කෙළවර වේ ය යන අශාස්වත දෘෂ්ටියද පසෙකින් තබා මධ්‍යස්ථ වීමට බුදුසමය පළමුව අනුශාසනා කරයි. [8] සත්වයා හා ලෝකය

ශාස්වත යැයි ද අශාස්තවයැයි ද කීමට ඉක්මන් නොවූ මැදිහත් බවෙහි ම පිහිටි බුදුන් වහන්සේ ඇති තතු කවරේදැයි දකිනු කැමැත්තවුනට එය දැන දැකගැන්මට උපකාරීවන විශ්ලේෂණාත්මක අධ්‍යයනය ඉගැන්වූහ. ඛන්ධායතන ධාතු විභාගය වදාළහ. ප්‍රකට වශයෙන්ම එබදු විභජන ක්‍රම හෙවත් විශ්ලේෂණ ක්‍රම සතරක් පෙළ දහමෙහි දක්නා ලැබෙයි.

1. පඤ්චස්කන්ධ විභාගය.
2. ෂඩ්ධාතු විභාගය.
3. අට්ඨාරසධාතු විභාගය.
4. ද්වාදස ආයතන විභාගය.

මේ වූකලී බුදුසමයෙහි දැක්වෙන සත්වයා හා ලෝකය පිළිබඳ ප්‍රමුඛතම විශ්ලේෂණ සතරය. මේ හැර වෙනත් විශ්ලේෂණ ද දක්නා ලැබෙන නමුදු ඒ සියල්ල මෙම විශ්ලේෂණයන් පදනම් කොටගෙන ඇත. මෙහිදී සිදුවන්නේ ආනුභවික සත්තාව මූලසාධක හෙවත් ශක්තීන්ට බෙදා දැක්වීමයි. ආනුභවික සත්තාව, සත්වයා හා ලෝකය යනු මෙකී ස්කන්ධ, ධාතු ආයතනාදීන්ගේ සංයෝගයක් සමවායක් බව පෙන්වාදීම මෙම විශ්ලේෂණයේ එක් අරමුණකි. සත්වයා , ලෝකය යනු ස්වාධීන වූ තනි ඒකකයක්, නොබෙදිය හැක්කක් නොවන බවත්, සම්මුතියක් වූ එය මූල සාධක සමූහයක එකතුවක් බවත්, මෙහිදී පෙන්වා දෙනු ලැබේ.[9] මෙහි පළමු ක්‍රමය සත්වයා හා ලෝකය ස්කන්ධ පහක සමවායක් ලෙස හඳුන්වා දෙයි. එනම් රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යනුවෙනි. සතර මහා භූතයන්ගේ ද (පඨවි, ආපෝ, තේජෝ, වායො) ඒහා බැදුනු උපාදාය රූපයන්ගේද සංයෝගය (වණ්ණ, ගන්ධ, රස, ඕජා) රූපයයි. ශීතෝෂ්ණාදියෙන් විකාර භාවයට විකෘතියට පත්වන රූපය (කය, ශරීරය) භෞතිකය. වේදනා යනු සංවේදනයයි. විඳීමයි.[10] සුඛ, දුක්ඛ, උපේක්‍ෂාදී වශයෙන් එහි ප්‍රභේද පර්යාය වශයෙන් නොයෙක් නයින් දැක්වේ.[11] සඤ්ඤා යනු සංජානනයයි. රූප සඤ්ඤා සද්ද සඤ්ඤාදී වශයෙන් එහි ප්‍රභේද දක්වනු ලැබේ.[12] සංඛාර යනු සංචෙතනයයි. කර්මයයි. කාය සංඛාර, වචී සංඛාර, මනෝ සංඛාරාදී නයින් එහි ප්‍රභේද දැක්වෙයි.[13] විඤ්ඤාණ





යනු විජානනයයි.[14] අරමුණු දැන ගැන්මයි. චක්ඛු විඤ්ඤාණ සොත, විඤ්ඤාදී වශයෙන් එහි ප්‍රභේද පෙන්වා දී ඇත.[15] ෂඩ්ධාතු විභාගය අනුව සත්වයා හා ලෝකය ධාතු නමින් හැඳින්වෙන මූල සාධක සයකට බෙදා දැක්වෙයි. එනම් පඨවි (දැඩි, තද බව) ආපො (වැගිරෙන, දියර ගතිය) තේජෝ (උණුසුම, ගින්න) වායෝ (හමායාම, සුළඟ) ආකාස (අවකාශය) විඤ්ඤාණ (විජානනය) යනුවෙනි.[16] අට්ඨාරස ධාතු විශ්ලේෂණය මගින් මූලසාධක අටළොසක් දැක්වෙයි. චක්ඛු, සොතාදී ධාතු සයෙකි. රූප, ශබ්දාදී ධාතු සයෙකි. චක්ඛු විඤ්ඤාණ, සොත විඤ්ඤාණාදී ධාතු සයෙකි. ද්වාදස ආයතන විභාගය චක්ඛුරාදී ආයතන සයද රූපාදී ආයතන සයද දක්වයි.[17] මෙසේ ලෝකය හා සත්වයා ස්කන්ධ වශයෙන් පසෙකටද ධාතු වශයෙන් සයකට හා අටළොසකටද ආයතන වශයෙන් දොළහකටද විශ්ලේෂණය කිරීම පෙළදහමෙහි නිබඳව ම දක්නා ලැබේ.

ඉහත දක්වන ලද විශ්ලේෂණ විධි සතරෙහි ස්වභාවය සලකා බැලීම ද මෙහිදී වැදගත් වෙයි. මෙහිදී මානසික අභ්‍යන්තරික සාධක (නාම ධර්ම) මෙන්ම භෞතික, බාහිර සාධක (රූප ධර්ම ද) අවධානයට ලක්වී තිබීම එක් කරුණකි. මෙකී සියලූ විශ්ලේෂණයන්හි එන මූල සාධක සියල්ල නාම රූප වශයෙන් දෙයාකර වෙයි. ස්කන්ධ විභාගයෙහි නාම (චිත්ත, චෛතසික) සතරකි. රූප එකකි. ෂඩ් ධාතු විභාගයෙහි නාම එකකි. රූප පසෙකි. අටලොස් ධාතූන්හි නාම අටෙකි. රූප දහයකි. ද්වාදස ආයතන අතර නාම දෙකකි. රූප දහයකි. එසේම බුද්ධ සමය තුළ විශ්ලේෂණය සඳහා අනිවාර්ය වූ එකම ක්‍රමයක් නොමැති බවද අදාළ අරමුණට අනුව විවිධ විශ්ලේෂණ විධි යොදාගෙන ඇති බවද පෙනේ. සංඛ්‍යාමය විවිධත්වය ද මීටම අදාළ වෙයි. ඒ අනුව බුද්ධසමය තුළ සංඛ්‍යාව වැදගත් නොවන බව මෙහිලා විවිධ සංඛ්‍යාවන් දක්නට ලැබීමෙන් පැහැදිලි වෙයි. මෙහි ස්කන්ධ විභාගය තුළ රූපය එකක් සේ ගෙන ඇති අතර, ෂඩ් ධාතු විභාගයෙහි රූපයම සාධක පහක් දක්වා විශ්ලේෂණය කර ඇත. එසේම ෂඩ් ධාතු විභාගයෙහි නාම එකක් ලෙස දැක්වෙන නමුදු ස්කන්ධ විභාගයේ නාම සතරක් පෙනෙයි. සෙසු විශ්ලේෂණ ක්‍රම විමසීමෙන්ද මෙම කරුණ හෙළිකරගත හැකිය. මෙයින් පැහැදිලි වන්නේ විටෙක සැකෙවින්ද විටෙක

සවිස්තරවද විශ්ලේෂණය සිදුකර ඇති බවය. එසේම අවශ්‍ය නම් වැඩිදුරටත් විශ්ලේෂණය කිරීමට අවස්ථාව තිබෙන බවය. මෙම අවස්ථාවන් පශ්චාත්කාලීනව අභිධර්මයෙහි ලා ඉතා ඕනෑකමින් ප්‍රයෝජනයට ගෙන ඇති බවද කිව යුතුය. අභිධර්මය වූ කලි ආදි බෞද්ධ විශ්ලේෂණ ක්‍රමය මෙන්ම සංශ්ලේෂණ ක්‍රමය ද පිළිබඳ වර්ධනයක් පෙන්නුම් කරන්නකි. උක්ත විශ්ලේෂණ ක්‍රම අතර සම්බන්ධයක් ප්‍රකට වන බවද මෙහිදී පෙනීයයි. නිදසුන් වශයෙන් අටලොස් ධාතු විභාගයෙහි ධාතු නාමයෙන් දක්වන ලද සාධකම ආයතන විභාගයෙහි ආයතන නාමයෙන් හඳුන්වා ඇත. ස්කන්ධයක් සේ වීටෙක නම් කරන විඥ්ඥානය ධාතුවක් ලෙසද වීටෙක නම් කරනු ලැබේ.

ආදී බුදුසමයෙහි සත්වයා හා ලෝකය බෙදා දක්වනු ලබන මෙම මූල සාධක (එනම් ස්කන්ධ, ධාතු, ආයතනාදිය) හැඳින්වීම පිණිස සූත්‍රාන්තයන් හි පාරිභාෂික පද කිහිපයක් නිතර යෙදී තිබේ. "ධම්මා" යන්න ඉන් එකකි. එම පදය වෙනත් අර්ථයන්හි ද යෙදී ඇතත් දාර්ශනික වශයෙන් ආනුභවික සත්තාවෙහි මූල සාධක ඉන් අදහස් කෙරෙන බව සැලකිය හැකිය.[18] "සබ්බ" තවත් පදයෙකි. එහිද මතුපිට අර්ථයක් ඇතත් සූත්‍රාන්තයන්හි ම දැක්වෙන පරිදි ඉන් උක්ත මූල සාධකයන් අර්ථවත් වෙයි.[19] "ලොක" ශබ්දය ද මෙම අරුතින් ම යෙදේ. බිදෙන පලුදුවන බැවින් මෙකී ස්කන්ධාදී සාධක ලෝක නම් වේ යැයි ද කියා ඇත. [20]

බුදුසමය වූකලී යථාර්ථය ප්‍රියකරන, යථාර්ථය සොයායන යථාර්ථය දැක්මට ප්‍රජාව පොළඹවන ධර්ම මාර්ගයකි.[21] එය මූලික ඉගැන්වීම් ලෙස හැඳින්විය හැකි පටිච්ච සමුප්පාදය, චතුරාර්ය සත්‍යය හා ත්‍රිලක්ෂණය ද එකී යථාර්ථ දර්ශනය ඉදිරිපත් කරයි. එකිනෙකට සම්බන්ධ වූ එම ඉගැන්වීම්වලට පාදක වන, මධ්‍යගත වන ඉගැන්වීම් වන්නේ මෙම විශ්ලේෂණාත්මක අධ්‍යයනයයි. ලෝකය, සත්වයා යනුවෙන් අප විසින් සලකා ගනු ලබන සම්මුති මාත්‍ර වූ යමක් වේද එය ස්කන්ධ ධාතු ආයතනාදී





මූල සාධකයන්ගේ සමවායක් වන්නේය. එකී ධර්ම පටිච්ච සමුප්පන්නය. ඒ කිසිවක් අප්පටිච්ච සමුප්පන්න නොවේ යැයි පැහැදිලි කිරීම බුද්ධ දේශිත පටිච්ච සමුප්පාද ධර්මයෙහි අරමුණයි. එසේම එම ධර්ම කිසිවක් නිත්‍ය ,සුඛ, ආත්ම වශයෙන් සලකාගත නොහැකිය. සියල්ල අනිත්‍යය, දුකය, අනාත්මයැයි දැක්වීම ත්‍රිලක්ෂණ දේශනාවෙහි අභිප්‍රායයි. ත්‍රිලක්ෂණ ධර්මයෙහි දෙවැන්නා වූ දුක්ඛ ලක්‍ෂණය ද එහි සමුදය ද එහි නිරොධය ද එම නිරෝධගාමිනී පටිපදාවද ඉගැන්වීම චතුරාර්ය සත්‍යයෙහි අපේක්‍ෂාවය.

ධම්මා නමින් ගැනෙන සියල්ල පටිච්ච සමුප්පන්න වෙයි. එනම් හේතු ප්‍රත්‍ය ඇති කළ ඇතිවෙත් නැති කළ නැතිවෙත්, බුදුරදුන්ගේ ප්‍රමුඛතම ඉගැන්වීම එයයි. යම් සේ කිසියම් බීජයක් කෙතෙහි වපුල කල්හි පෘථුවි සාරය තෙතමනය ආදී හේතු ප්‍රත්‍ය ඇති කල්හි පැලවන්නේද ඛන්ධායතන ධාතුහු ද හේතු ප්‍රත්‍ය ඇති කළ ඇතිවෙත් නැති කළ නැතිවෙත් [22] මේ අනුව ලෝකය, සත්වයා යන්නෙන් සැලකෙන සම්මුති මාත්‍ර වූ මෙම විශ්ලේෂිත සාධක කිසිවක් තනි තනිව, වියුක්තව, ස්වාධීනව නොපවත්නේය. එම සාධකයෝ එකිනෙක අපේක්‍ෂා කරත්, එකිනෙකට උපකාරී වෙත්. එසේ සාපේක්‍ෂක වූ එම ධර්මයෝ නොසිදී පවතිත්. එම පැවැත්මට ම සංසාරය යැයි කියනු ලැබේ. [23] ධර්ම කිසිවක් ස්වාධීන නැත. ස්වතන්ත්‍ර නැත. ස්වෛරී නොවේ. සියල්ල පරාධීනය. පරතන්ත්‍රය, අස්වෛරීය, පරාපේක්‍ෂා සහිතය. පටිච්ච සමුප්පාදයෙන් ඉගැන්වෙන මෙම යථාර්ථය දැකීම විශ්ලේෂිත මූල සාධක පිළිබඳ සංශ්ලේෂණාත්මක අවබෝධය වේ. (Synthesis)

ධම්මා යන්නෙන් ගැනෙන ඛන්ධායතන ධාතු සියල්ල අනිත්‍යය, දුකය, අනාත්ම යැයි වෙන වෙනම ගෙන හෙළි දරව් කිරීම ත්‍රිලක්‍ෂණ දේශනාවෙහි කාර්ය සංසිද්ධිය වේ.ඒ අනුව හේතු ප්‍රත්‍ය ධර්මයට අනුගත වූ සියලු සංස්කාර ධර්මයන් අනිත්‍යය. බිදෙයි, වෙනස් වෙයි. පෙරළෙයි. නිත්‍ය, සදාකාලික , ධ්‍රැව, අවිනශ්වර, ශාස්වත ස්වභාවයෙක් ඒ

කිසිවක නැත. රූපය අනිත්‍යය, වේදනාව අනිත්‍යය යනාදී වශයෙන් ඒ ඒ ස්කන්ධයන් ද[24] ඇස අනිත්‍යය, රූපය අනිත්‍යය, චක්ඛු විඤ්ඤාණය අනිත්‍යය යනාදී වශයෙන් ධාතු ආයතනයන් ද [25] වෙන් වෙන්වැගෙන සියලු ධර්මයන්ගේ අනිත්‍ය බව පෙන්වා දෙනු ලැබේ. යමක් අනිත්‍ය වන්නේද එය දුක් සහිතය[26] අනිත්‍ය වූ ධර්මයෝ කිසි කලෙකත් සුවදායක නොවෙත්. යමක් දුක් සහිත වේද එය අනාත්මය. [27] අත්තනො, ස්වත, ස්වීය ලක්ෂණයෙන් තොරය. රූපාදි ස්කන්ධයයන් වෙන් වෙන්ව ගෙන මගේය. (මට අයත්ය) මම වෙමි. (මෙයින් මා නියෝජනය වේ) මගේ ආත්මයයැයි සලකා ගැන්මට අශ්‍රැතවත් ජනයා යොමුවෙයි. එහෙත් එම ස්කන්ධයන් සියල්ල මගේ නොවේ. (මට අයත් නැත) මට නොවෙමි. (ඒ කිසිවකිනුත් මා නියෝජනය නොවේ) මගේ ආත්මය නොවේ යැයි සලකාගත යුත්තේය, එයම යථාර්ථ දර්ශනයයි.[28] ඇති තතු දැක්මයි.

මෙසේ ඇති තතු දක්නා ආර්ය ශ්‍රාවකයා ඛන්ධායතන ධාතුන් කෙරේ කලකිරෙයි. කලකිරෙන්නේ එහි නොඇලෙයි. නොඇලෙනුයේ ඉන් මිදෙයි. මිදී ගත්තේ මිදුනේ යැයි වටහා ගනී. [29] බුදු දහම නිබඳවම පෙන්වා දෙන පරිදි  අසාර වූ අතෘප්තිකර වූ තුච්ඡ වූ මෙම සංසාරික පැවැත්මෙන්, ස්කන්ධ ධාතු ආයතනාදීන්ගේ පටිච්ච සමුප්පන්න ප්‍රවෘත්තියෙන් අත්මිදීම පිණිස මෙකී යථාර්ථ දර්ශනයට මැ එළඹිය යුතුය. සියල්ල හුදෙක් පටිච්ච සමුප්පන්න වූ අනිත්‍ය දුක්ඛ අනාත්ම වූ මූල සාධක සමූහයක් බව පසක්කරගත යුතුය. බුදුසමයෙහි පරම අපේක්ෂාව වන්නේ නිර්වේදය නොඇලීම. සත්සිදීම අවබෝධය සම්බෝධිය හා නිර්වාණය හෙළි පෙහෙළි කිරීමය.[30]





**පාදක සටහන් ...**

01. Pali - English Dictionary
    RHYS Davidos T.W. and wiliam stete - පිට 629
02. කො නුඛො ඉමස්ස භගවතා සංඛිත්තේන උද්දෙසස්ස උද්දිට්ඨස්ස විත්ථාරෙන අත්ථං අවිභත්තස්ස විත්ථාරෙන අත්ථං විභජෙය්‍යාති.
    ම. නි. 3 උද්දෙස විභංග සූත්‍රය - පිට 470
03. එවං පරියාය දෙසිතො ඛො මයා පනානන්ද ධම්මො
    ම. නි. 2 බහුවේදනීය සූත්‍රය - පිට 102
04. අත්ථි භික්ඛවේ පඤ්හො විභජ්ජ ව්‍යාකරණියො
    අ. නි. 2 පඤ්හ ව්‍යාකරණ සූත්‍රය - පිට 90
05. විභජ්ජවා වාදෝ එතස්සාති විභජ්ජවාදි
    විමති විනෝදනී ටීකා - 27
06. දුක්ඛෙ ලොකො විතිට්ඨිකො
    ස. නි. උඩ්ඩිත සූත්‍රය - පිට 74
07. ඉදං දුක්ඛන්ති ඛො මයා ඛ්‍යාකතං අයං දුක්ඛ සමුදයන්ති ....... අයං දුක්ඛ නිරෝධයන්ති...... අයන් දුක්ඛ නිරෝධගාමිණී පටිපදන්ති ඛො මයා ඛ්‍යාකතං
    ම. නි. 2 චූලමාලුක්‍ය සූත්‍රය . පිට 162
08. ද්වය නිස්සිතො ඛෝ යං කච්චාන ලොකො යෙභුය්‍යෙන අත්ථිතංචෙව නත්ථිතංච ....... එතෙ තෙ කච්චාන උභො අන්තෙ අනුපගම්ම මජ්ඣෙන තථාගතො ධම්මං දෙසෙති.
    ස. නි. 2 කච්චාන වග්ග සූත්‍රය - පිට 28
09. යථාහි අංග සම්භාරා - හෝති සද්දො රථො ඉති
    එවං ඛන්ධෙසු සන්තෙසු- හොති සත්තොති සම්මුති
    ස. නි. 1 වජිරා සූත්‍රය - පිට 246
10. වෙදෙති වෙදෙතී'ති ඛො ආවුසො තස්මා වෙදනාති වුච්චති
    ම. නි. 1 මහාවෙදැල්ල සූත්‍රය. පිට 688

11. සංජානාති සංජානාතීති ඛො ආවුසො තස්මාසඤ්ඤති වුච්චති

එම

12. තයො මෙ භික්ඛවෙ සංඛාරා කාය සංඛාරො වචී සංඛාරො, චිත්ත සංඛාරො ඉමෙ වුච්චන්ති භික්ඛවෙ සංඛාරා

ස.නි. 2 විභංග සූත්‍රය - පිට 06

13. විජානාති විජානාතී ති ඛො ආවුසො තස්මා විඤ්ඤාණන්ති වුච්චති

ම. නි. 1 මහාවෙදැල්ල සූත්‍රය - පිට 686

14. ම. නි. 1 මධුපිණ්ඩික සූත්‍රය - පිට 280

15. ඡ ඉමා භික්ඛු ධාතුයො, පඨවිධාතු ආපොධාතු ..........

ම. නි. 3 ධාතු විභංග සූත්‍රය - පිට 500

16. ඡ අජ්ඣත්තිකානි ආයතනානි වෙදිතබ්බානි ඡ බාහිරානි ආයතනානි වෙදිතබ්බානි

ම. නි. 3 සළායතන විභංග සූත්‍රය - පිට 458

17. යෙ ධම්මා හේතුප්පභවා - තෙසං හේතුං තථාගතො ආහ

මහාවග්ග, 1 - පිට 84

18. කිංච භික්ඛවෙ සබ්බං, චක්ඛුං චෙව රූපා ච, සොතං චෙව සද්දාච, ඝාණංච ගන්ධාච ..........

ස. නි. 4 සබ්බ සූත්‍රය පිට 30

19. ලුජ්ජතීති ඛො භික්ඛු තස්මා ලොකොති වුච්චති කිඤ්ච ලුජ්ජති චක්ඛුංච ඛො භික්ඛු ලුජ්ජති රූපා ලුජ්ජන්ති .......

ස. නි. 4 ලොක සූත්‍රය පිට 116

20. යථාභූතං ඤාණ දස්සනං උදපාදි

ස. නි. 5 ධම්මචක්කප්පවත්වන සූත්‍රය පිට

21. යථා අඤ්ඤතරං බීජං ඛෙත්තෙ වුත්තං විරූහති
පඨවි රසංච ආගම්ම සිනෙහංච තදූභයං
එවං ඛන්ධාච ධාතුයො ඡ ච ආයතනා ඉමෙ
හේතුං පටිච්ච සම්භූතා හේතු භංගා නිරුජ්ඣරෙ

ස. නි. 1 සෙලා සූත්‍රය පිට 244





22. ඛන්ධානං පටිපාටි ධාතු ආයතනානිච අබ්බොච්ඡින්නං වත්තමානං සංසාරොති පවුච්චති

වි. මා. පටිච්චසමුප්පාද නිර්දේශය - පිට 423 (සංස්කරණය බුද්ධ දත්ත හිමි, පොල්වත්තේ)

23. රූපං අනිච්චං, වෙදනා අනිච්චා, සඤ්ඤා අනිච්චා සංඛාරා අනිච්චා, විඤ්ඤාණං අනිච්චන්ති

ම. නි. 1 චූල සච්චක සූත්‍රය - පිට 540

24. චක්ඛුං අනිච්චං, රූපා අනිච්චා, සොතං අනිච්චං, සද්දා අනිච්චා .............. මනො අනිච්චා, ධම්මා අනිච්චාති

අ.නි. 6 ගිරිමානන්ද සූත්‍රය - පිට 195

25. යදනිච්චං තං දුක්ඛං .........

26. යං දුක්ඛං තදනත්තං ..........

27. රූපං නෙතං මම නෙසො හමස්මිං නෙසො මෙ අත්තාති සමනුපස්සති වේදනං නෙතං මම ............

ම. නි.1 අලගද්දූපම සූත්‍රය - පිට 340

28. එවං පස්සං සොණ සුතවා අරියසාවකො රූපස්මිං නිබ්බින්දති, වේදනාය පි නිබ්බින්දති , සඤ්ඤාය පි නිබ්බින්දති ,සංඛාරෙසුපි නිබ්බින්දති , විඤ්ඤණස්මිං පි නිබ්බින්දති ,නිබ්බින්දං විරජ්ජති විරාගා විමුච්චති විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති.

ස. නි. 3 සෝණ සූත්‍රය - පිට 87 (බොහෝ සූත්‍රවල)

29. නිබ්බිදාය විරාගය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය සංවත්තති

ම. නි. 2 මඛාදේව සූත්‍රය - පිට 464 (බොහෝ සූත්‍රවල)